**ශීර්ෂය 17 - පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 17 - පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 11 දින සභානායකතුමාගේ කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 36.95 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 36.30 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 0.65 ක් හෙවත් සියයට 1.76 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 34.90 | 34.35 | 0.55 | 1.58 |
| මූලධන | 2.05 | 1.95 | 0.10 | 4.88 |
| **එකතුව** | **36.95** | **36.30** | **0.65** | **1.76** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කාර්යාලයට අදාළ විෂය අංක 01701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.00 | 1.96 | 0.80 | 1.64 | 4.00 | 3.24 |

**2.3 විගණන නිරීක්ෂණය**

පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 01701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු රු.128,800 ක් වූ ආපදා ණය ශේෂයක් වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණු නමුත්, එම හිඟහිටි ණය ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**3.2 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවන් පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 1980 අප්‍රේල් 01 දිනැති අංක 162 දරන චක්‍රලේඛයේ 05 ඡේදය | කාර්යාලය වෙත වාර්තා කළ බවට කිසිඳු සාක්ෂියක් නොමැතිව සම්බන්ධීකරණ ලේකම් තනතුර දරන නිලධාරීන් දෙදෙනෙකු වෙත රු.1,287,333 ක වැටුප් සහ දීමනා ගෙවා තිබුණි. |
| (ආ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන චක්‍රලේඛයේ 02(iv) උප ජේදයේ | නිත්‍ය රාජකාරි වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වුවත්, එසේ කිරීමකින් තොරව කාර්යාලය විසින් රු.361,500 ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 10 | 08 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 16 | 15 | 01 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 03 | 02 | 01 |
| | **එකතුව** | **33** | **29** | **04** |